# 2022 නොවැම්බර් මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.11.17**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා

අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ නොවැම්බර් මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය හා මාධ්‍යවේදී ප්‍රේමසිරි මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

අද දින 2023 අයවැය කෙටුම්පත සම්මත කර ගන්නා සුවිශේෂී දිනයක් ලෙස සඳහන් කළ හැකිය. ප්‍රාදේශීය සභා ඉතිහාසය තුළ නව මගක් ගොඩනැංවීම සඳහා අද දින 2023 අයවැය කෙටුම්පත මගින් අපේක්ෂා කරන බව ප්‍රකාශ කර සිටින ලදී.

**(අ) (i) 2022.10.18 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.10.18 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.10.18 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ, ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතා, එල්.එච්. කුමුදු සුජීව මහතා එවා ඇති නිවාඩු ලිපි නිවේදනය කරන ලදී.

ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා අද දින ද මහා සභාව සඳහා නිවාඩු ලිපියක් යොමු කර තිබුණද, ඔහු මීට පෙරත් දිගින් දිගටම මහා සභාවට කිසිදු දැනුම් දීමකින් තොරව නොපැමිණ ඇති නිසාත්, ඇතැම් අවස්ථාවල නිවාඩු ලිපි වැරදි අත්සනකින් යුතුව ඉදිරිපත් කර සභාව නොමග යැවීමට කටයුතු සිදු කර ඇති නිසාත්, ඔහුගේ නිවාඩු ලිපිය මහා සභාව විසින් අනුමත කළ නොහැකි බවත්, මේ සම්බන්ධයෙන් නීති උපදෙස් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය මගින් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කර ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට කටයුතු කර ඇති බව අද දිනත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

එසේම, ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. සිසිර කුමාර මහතා විසින් එවා ඇති නිවාඩු ලිපිය පරිදි එතුමන්ගේ නිවාඩුව මහා සභාව විසින් අනුමත කරන ලදී.

II. තිස්සමහාරාම බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ගොඩනැගිලි සංවර්ධන අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස දක්වා සැලසුම් කමිටුවට යොමු කරන ලද සැලසුම්පත් ලේඛන ගරු මහා සාබවට ඉදිරි කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

| **2022 ඔක්තොම්බර් මාසය- සැලසුම් කමිටු වාර්තාව** | | | | |
|---|---|---|---|---|
| අනු අංක | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
| 1 | අ/බෙ./2022/87 | ජේ.පී.සී.කේ.ජයකොඩි | අනුමත විය | 2022.10.11 |
| 2 | අ/බෙ/2022/85 | ඒ.චන්ද්‍රාවතී | නොවිය | 2022.10.11 |
| 3 | අ/බෙ/2022/56 | අරවින්ද අබේදීර | අනුමත විය | 2022.10.11 |
| 4 | සං/අ/2021/115 | ඒ.එම්.අනුර | අනුකූ.ස.අනුමත වීය | 2022.10.11 |
| 5 | සං/අ/2019/87 | සුලාන් ලහිරු ජයවර්ධන | අනුකූ.ස.අනුමත වීය | 2022.10.11 |
| 6 | සං/අ/2019/20 | ඩබ්.ජී.සරත් | අනුකූ.ස.අනුමත වීය | 2022.10.11 |

| | | | | |
|---|---|---|---|---|
| 7 | සං/අ/2020/139 | ඩබ්.ඒ.නිශාන් මධුරංග | අනුමත විය | 2022.10.11 |
| 8 | සං/අ/2022/61 | ඒ.එච්.හර්බට් සිල්වා | අනුකූ.ස.අනුමත වීය | 2022.10.11 |
| 9 | සං/අ/2022/70 | ජේ.පී.සී.කේ.ජයකොඩි | අනුමත විය | 2022.10.11 |
| 10 | අ/බෙ/2022/92 | සජිත් කෞෂලා වීරසිංහ | අනුමත නොවිය | 2022.10.21 |
| 11 | අ/බෙ/2022/90 | කේ.ඒ.චානක කුලතුංග | අනුමත විය | 2022.10.21 |
| 12 | අ/බෙ/2022/89 | සී.ආර්.එච්.අමරසිංහ | අනුමත විය | 2022.10.21 |
| 13 | සං/අ/2018/87 | ඩබ්.ඒ.තිළිණ රංගජීව | අනු.ස.අනුමත විය | 2022.10.21 |
| 14 | සං/අ/2022/32 | සංදීප් ජයවර්ධන | අනුමත විය | 2022.10.21 |
| 15 | සං/අ/2022/26 | ප්‍රගීත් චන්දිමාල් | අනු.ස.අනුමත විය | 2022.10.21 |
| 16 | සං/අ/2022/50 | පී.ජී.නිමල් | අනු.ස.අනුමත විය | 2022.10.21 |
| 17 | සං/අ/ 2022/77 | ඩබ්.එල්.ජී.ප්‍රියන්ත | අනු.ස.අනුමත විය | 2022.10.21 |
| 18 | සං/අ/2022/74 | ටී.එන්.රාමසිංහ | අනුමත වීය | 2022.10.21 |
| 19 | සං/අ/2021/75 | ටී.එන්.රාමසිංහ | අනුමත වීය | 2022.10.21 |
| 20 | සං/අ/2022/59 | පී.පී.සී.කුමාර | අනු.ස.අනුමත විය | 2022.10.21 |
| 21 | සං/අ/2022/65 | අරවින්ද අබේදීර | අනුමත විය | 2022.10.21 |
| 22 | සං/අ/2022/78 | ඩබ්.එල්.ජී.ප්‍රියන්ත | අනුමත වීය | 2022.10.21 |
| 23 | සං/අ/2022/81 | එම්.එජ්.දේශප්‍රිය | අනුමත විය | 2022.10.21 |
| 24 | සං/අ/2022/51 | එස්.වී.ඒ.පුෂ්ප කුමාර | අනුමත විය | 2022.10.21 |
| 25 | සං/අ/2022/80 | කේ.ඒ.සී.ආර්.කුලතුංග | අනුමත විය | 2022.10.21 |
| 26 | සං/අ/2022/72 | ජී.ඒ.ඉෂාන් චතුරංග | අනුමත විය | 2022.10.21 |

## (ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන

I. දකුණු පළාත්, ගරු ආණ්ඩුකාරතුමා විසින් එවා ඇති අංක G/SP/02/03/02/01 හා 2022.10.31 දිනැති ලිපිය මගින්, පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා පෝෂණීය ආහාර ලබා දීමේ වැඩසටහන ඔක්තෝම්බර් මාසයේ ක්‍රියාත්මක කල බැවින්, දෙවන අදියර ලෙස දකුණු පළාතේ, පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් හට නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී පෝෂණීය ආහාරවේලක් සතියකට දින දෙක බැගින් ක්‍රියාත්මක කරන ලෙසටත්, එම වැඩසටහන සඳහා පළාත් පාලන ආයතනය සතු අරමුදල් යොදවමින් ක්‍රියාත්මක කරන ලෙසටත් ගරු ආණ්ඩුකාරතුමාගේ අත්සනින් යුතුව එවා ඇති ලිපිය මගින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා පෝෂණ ආහාරවේල ලබා දීම මෙම වසරේ ක්‍රියාත්මක කළා සේම, මෙම වැඩසටහන 2023 වසරේද ක්‍රියාත්මක කිරීම සඳහා 2023 අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කර ඇති බව දන්වා සිටින ලදී.</u>

II. හම්බන්තොට දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්ගේ අංක HB/LAE/18/Tis හා 2022.10.17 දිනැති ලිපිය මගින්, ලැබී ඇති අංක 2289/06 හා 2022.07.18 දිනැති අති විශේෂ ගැසට් මගින්, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභිකයින් වන ඩබ්.කේ.කේ.කේ. ශාන්තිලතා මහත්මිය සහ එම්.එල්.එම්. හනීෆා මහතාගේ සභික ධූරය අහෝසි වීම මත අදාළ දිනෙන් පසුව එම සභිකයින් මහා සභාව සඳහා පෙනී සිටි මාස වෙනුවෙන්, එම ගරු සභිකයින් දෙදෙනා වෙත ගෙවන ලද සභික දීමනා, ඉන්ධන දීමනා, දුරකතන දීමනා වලට අදාළ මුදල් නැවත තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම් කරන ලෙසට අප ආයතනය විසින් ලිපියක් මගින් දන්වා යැවූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

III. ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා ඉදිරිපත් කර ඇති ප්‍රශ්නාවලිය ගරු සභාපතිතුමා විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. දෙබරවැව පොදු වෙළඳපොළ ධීවර ගොඩනැගිල්ල 2022 දේපළ ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් වී ඇත්ද? නැද්ද?
II. ටෙන්ඩර් වී ඇත්නම් ටෙන්ඩර් වූ දිනය කවදාද?
III. ඉහත දේපළ 2022 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දී ඇත්තේ කවුරුන් හටද?
IV. ඉහත දේපළ ටෙන්ඩර් වී නොමැති නම් 2022 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දී ඇති ක්‍රමවේදය කුමක්ද?
V. ඉහත දේපළ මගින් ජනවාරි සිට ඔක්තෝම්බර් මාසය දක්වා ලැබී ඇති ආදායම වෙන් වෙන්ව දක්වන්න.

✓ ඉහත ප්‍රශ්නාවලියට අදාළ පිළිතුරු ලබා ගැනීම සඳහා ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ඒ.පී. ධම්මික මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාවේ ලේකම්තුමිය විසින් ප්‍රශ්නාවලියට අදාළ පිළිතුරු සභා ගත කරන ලදී.

I. ටෙන්ඩර් වී නොමැත.
II. -
III. එරාන් චමින්ද රාජපක්ෂ
IV. ටෙන්ඩර් මණ්ඩල තීරණය අනුව, ඉල්ලීම් ලිපියක් මගින් අනුමැතියට යටත්ව බදු අයිතිය ලබා දී ඇත.
V. 2022 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා බදු වාරික සියල්ල ගෙවා ඇත. (මාසික වාරික මුදල රු. 1,012.50 කි)

✓ ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ඒ.පී. ධම්මික මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි. (1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168(1) වගන්තිය අනුව)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>අප පාලන කාලය ආරම්භය තුළ අයවැය මගින් විශාල වැඩසටහන් රාශියක් සිදු කර ජනතාවට සේවාවක් ඉටු කළද, පසුගිය වර්ෂයන් කිහිපයක් පුරාවට රට තුළ ව්‍යාප්ත වූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සහ රටේ ඇති වූ ආර්ථික අර්බුධකාරී තත්ත්වයන් හේතුවෙන් ප්‍රාදේශීය සභාවට ලැබුණු ආදායම පහළ බැසීම නිසා අපට හැකි අයුරින් වැඩසටහන් සිදු කර ජනතාවට හැකි පමණින් සේවක් ඉටු කිරීමට කටයුතු කරන ලදී. 2023 වසරේ අපගේ ආදායම තව තවත් වැඩි කර ගැනීමට බලාපොරොත්තුවෙන් මෙම අයවැය සකස් කර ඇති නිසා, 2023 අයවැය සුවිශේෂී අයවැයක් වන</u>

අතර, පසුගිය වසර 03 ක් පුරාවට සිදු කිරීමට නොහැකි වූ ජනතා සේවය සහ වැඩසටහන් 2023 අයවැය මගින් සිදු කිරීමට අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

2023 අයවැය කෙටුම්පතේ සාරාංශය ගත් කළ, අධ්‍යාපනය වෙනුවෙන් සභාවට පෙර පාසල් 10 ක් පවරා ගැනීම සහ දැනට සභාවේ පෙර පාසල් 06 ත් සමඟ පෙර පාසල් 16 ක දරුවන් සඳහා නිල ඇඳුම් ලබා දීම, සභාවේ පෙර පාසල් සඳහා පෝෂණ ආහාරවේලක් ලබා දීම, නව පෙර පාසලක් ආරම්භ කිරීම ආදිය සිදු කර ඇති බව සඳහන් කරන ලදී.

පුල්පල්ලම ප්‍රදේශයට නව පෙර පාසලක් ආරම්භ කිරීමේ ව්‍යාපෘතියේ දී ගරු උප සභාපතිතුමා ලබා දුන් මැදිහත්වීම සහ දැඩි දායකත්වයට එතුමන්ට ස්තූතිය පුද කරන ලදී.

එසේම ආයුර්වේද වැඩසටහන් පැවැත්වීමට සහ කාන්තා හා ළමා හිංසනය වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

තවද, තිස්ස වැවේ බෝට්ටු ජැටිය ඉදිකිරීම සඳහා 2023 අයවැය කෙටුම්පත මගින් මුදල් වෙන් කර ඇත. මෙකී කරුණ සම්බන්ධයෙන් කොට්ඨාස භාර ගරු සභික මහතා විසින් සොයා බලා කටයුතු කරන ලෙසටත්, මේ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුනහොත් මන්ත්‍රී ප්‍රතිපාදන මගින් හෝ ලබා ගෙන මෙම බෝට්ටු ජැටිය ඉදි කළ යුතු බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

එසේම 2023 අයවැය කෙටුම්පත සකස් කිරීමේ දී සත්‍ය ආදායම සහ සත්‍ය වියදම ලබා ගෙන කෙටුම්පත සකස් කිරීමට කටයුතු කර ඇති බවත්, ඒ වෙනුවෙන් මැදිහත් වී කටයුතු කළ ලේකම්තුමිය වෙත ස්තූතිය පුද කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා**

2022 වර්ෂයේ සකස් කරන ලද අයවැය අනුව, මේ දක්වා ලැබී ඇති ආදයම කොපමනද යන්න විමසීම් කරන ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි මෙනවියගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

ගරු සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් විමසීම් කළ පරිදි, ලේකම්තුමිය විසින් 2022 වර්ෂයේ මේ දක්වා ලැබී ඇති සත්‍ය ආදායම පිළිබඳව කරුණු පැහැදිලි කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

වරිපනම් සහ සභාවට ලැබිය යුතු සියලුම ආදායම් On line ගෙවීමට හැකි වන පරිදි වැඩපිළිවෙලක් කඩිනමින් සකස් කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා සිටින ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතාගේ සහ චතුමිණි දිල්ෂාණි මෙනවියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු මහා සභාවක් බවට පත් විය.

❖ **අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා**

ආදාහනයක් සිදු කළ පසුව, එම මිය ගිය පුද්ගලයා සිහිපත් වන පරිදි යම් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතු බැවින්, එකී වැඩසටහන ඉදිරියේදී කුමන ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ද යන්න විමසන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

දැනට ආදාහනයක් සිදු කළ පසුව, එම මිය ගිය පුද්ගලයා සිහිපත් වීමට ආදාහනාගාරය සඳහා මල් පෝච්චියක් ලබා දීමට එම මිය ගිය පුද්ගලයාගේ පවුලේ ඥාතීන් කටයුතු කරනු ලැබුවද, විශාල

වශයෙන් මල් පෝච්චි එම භූමියේ තිබීම නිසා එහි ඉඩකඩ ඇහිරී ගොස් ඇත. එම නිසා මේ සඳහා සුදුසු විකල්පයක් ලෙසත් ප්‍රයෝජනවත් ලෙසත් 2023 වසරේ සිට ආදාහන සිදු කළ පසුව, එම මිය ගිය පුද්ගලයා සිහිපත් වීමට ලබා දෙන මල් පෝච්චිය වෙනුවට අප ආයතනයේ පුස්තකාලය සඳහා පොතක් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සුදුසු වනු ඇත. තවද, එම පොත ලබා දීමේදී එම පොතෙහි මිය ගිය පුද්ගලයාට පිං පිණිස යනුවෙන් ලේබනයක්ද ඇලවීම සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

02. 2021 වසරේ ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මස දෙබරවැව පොදු වෙළඳපොළ හා පන්නෙගමුව පොදු වෙළඳපොළ පවත්වා නොමැති බවට බදුකරුවන් විසින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳ ආදායම් පරීක්ෂක නිලධාරී වාර්තා මගින්ද පෙන්වා දී ඇති බැවින්, ඒ අනුව එම මාස සඳහා බදු සහනයන් ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

ඉහතින් සඳහන් කර ඇති මාසයන් සඳහා රටේ පැවැති විවිධ තත්ත්වයන් හමුවේ පොළ නොපවත්වා ඇති බවට බදුකරුවන් විසින් ඉල්ලීම් කර ඇති නිසාත්, මේ සඳහා ආදායම් පරීක්ෂක වාර්තා ලබා දී ඇති නිසාත්, එම කාලය තුළ කොරෝනා රෝගී තත්ත්වය පැතිර යාම හේතුවෙන් පොදු වෙළඳපොළවල් පැවැත්වීම පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ගන්නා ලද තීන්දු තීරණ ඇතුළත් වාර්තාවන් සහ උපදෙස් ලිපි ද ලබා ගෙන, ඒ අනුව එකී මාසයන් සඳහා සහන ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

03. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය අංශයේ සේවක මහත්ම මහත්මීන් සඳහා ඔක්තෝම්බර් මාසයේ දිවා ආහාරය ලබා දීම වෙනුවෙන් බිල්පත් අංක 004 සහ 005 යටතේ රු. 80,640.00 ක මුදල සිසිල රෙස්ටුරන්ට් ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසු සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

තිස්සමහාරාම රජමහා විහාරස්ථානයේ මාස 02 ක කාලයක් පුරාවට බත් දන්සලක් ලබා දීමට කටයුතු කරන ලදී. එකී දන්සලෙන් අප ආයතනයේ සෞඛ්‍ය කම්කරුවන් සඳහා ද කෑම ලබා දීමට කටයුතු කළ නිසා 2022 වර්ෂයේ අගෝස්තු, සැප්තැම්බර් මාසයන් සඳහා කෑම පාර්සල් ලබා ගැනීම සිදු නොකරන ලදී. තිස්සමහාරාමයේ ධරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවටත්, අප ආයතනයේ සෞඛ්‍ය කම්කරුවන්ටත් මාස 02 ක කාලයක් පුරාවට මෙකී දන්සල මගින් දිවා ආහාරය ලබා දීමට කටයුතු කිරීම වෙනුවෙන් තිස්සමහාරාම රජමහා විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේට ස්තුති පූර්වක ලිපියක් යැවීමට කටයුතු කරන ලෙසට විෂය නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

04. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් Gestetner of Ceylon PLC ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු. 95,392.50 ක ඇස්තමේන්තුව පිළිගෙන, අලුත්වැඩියා කටයුතු කිරීමෙන් පසු එකී මුදල අදාළ ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

05. ප්‍රාදේශීය සභාවේ රථවාහන අලුත්වැඩියා සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

උප ලේඛනය

| | වාහන අංකය | අලුත්වැඩියාව | අදාළ ආයතනය | බිල්පත් අංකය හාදිනය | මුදල |
|---|---|---|---|---|---|
| 1 | ආයතනය සතු ටිපර් රථ, JCB, කම්ෆැක්ටර් රථ සඳහා | හයිඩ්‍රොලික් ඔයිල්, කූලන්ට්, ඉන්ජෙක්ටර් ක්ලීනර් ලබා ගැනීම වෙනුවෙන් | අයිඩියල් ෆස්ට් චොයිස් (පුද්) සමාගම | 970111887 / 22.09.28 | 124,239.88 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

ප්‍රාදේශීය සභාවේ වාහන සර්විස් කිරීමේ දී දැනට පවතින මිල ගණන් අනුව විශාල මුදලක් වැය කිරීමට සිදු වනු ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් යාන්ත්‍රික ඉංජිනේරු මහතා ද ගෙන්වා ගනිමින් සභාවේ වාහන පළමු වාර 02 සභාව සතු වාහන සේදුම් මධ්‍යස්ථානය වෙතින් සිදු කර 03 වන වාරය සර්විස් ආයතනයකින් සිදු කිරීම යෝග්‍ය වනවාද යන්න සොයා බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර සඳහා 37.5 Kg ගෑස් සිලින්ඩර් 05 ක් මිලදී ගැනීම වෙනුවෙන් වූ රු. 87,750.00 ක මුදල සෝමසිරි ස්ටෝර්ස් (අගුණුකොළපැලැස්ස) වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

උප ලේඛනය

රු. 50,000.00 ඉක්මවන ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | දෙබරවැව පොදු භූමියට ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ABC මිශ්‍රණ 03 ක්, ගල් කුඩු කියුබ් 01 හා ¾ ගල් කියුබ් 01ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉඳුනිල් කොන්ක්‍රීට් වර්ක්ස් | 255 2022.10.18 | 62,500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 02 | පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනයේ විදුලි කණු සිටුවීමට ¾ ගල් කියුබ් 04ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉඳුනිල් කොන්ක්‍රීට් වර්ක්ස් | 256<br>2022.10.18 | 66,000.00 |
| 03 | පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනයේ විදුලි කණු සිටුවීමට වැලි කියුබ් 04ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | නානායක්කාර සප්ලයර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | 052<br>2022.10.17 | 72,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. 2022 වර්ෂය සදහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සාමාජිකයින් ලෙස පහත සදහන් සාමාජිකයින්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. ගරු ප්‍රාදේශීය සභා සභික - පී.කේ. ආරියසේන මහතා
02. ප්‍ර.කළ.සේ.නිලධාරී - කේ.එන්.ජී. ප්‍රමිලා නදීෂිකා මිය (කමිටු සභාපති)
03. සංවර්ධන නිලධාරී - එස්.පී. නදීකා මධුභාෂිනි මිය
04. තාක්ෂණ සේවා නිලධාරී - එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය
05. කළමණාකරණ සේවා නිලධාරී - සඳුනි නරසිංහගේ මිය
06. කළමණාකරණ සේවා නිලධාරී - එම්. සඳුල්මිණි රිෂ්වණා මිය

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. 2022 වර්ෂය සදහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කිරීමට ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩල සාමාජිකයින් ලෙස පහත සදහන් සාමාජිකයින්ගෙන් යුත් කමිටුව පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

01. ගරු ප්‍රාදේශීය සභා සභික - පී.කේ. ආරියසේන මහතා
02. කළමනාකරණ සේවා නිලධාරී - ජේ.එම්. සමන්මලී මිය (කමිටු සභාපති)
03. සංවර්ධන නිලධාරී - කේ.එම්. නිමේෂා ලක්මාලි මිය
04. තාක්ෂණ සේවා නිලධාරී - එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය
05. කළමණාකරණ සේවා නිලධාරී - ආර්.කේ. චමිලා මධුවන්ති මිය
06. පරිගණක ක්‍රියාකරු - එල්.වයි. සුමංගලා සුබෝදිනී මිය

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. 2023 වර්ෂයේ පරිසර පොදු පහසුකම් කාරක සභාව සදහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. ගරු උප සභාපති - සුදත් විදානගමගේ මහතා (කමිටු සභාපති)
2. ගරු ප්‍රාදේශීය සභා සභික - පී.එල්. චාලි ගුණරත්න මහතා
3. ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.කේ.එම්. රෝහිත මහතා
4. ගරු ප්‍රාදේශීය සභා සභික - පී.කේ. ආරියසේන මහතා
5. ගරු ප්‍රාදේශීය සභා සභික - චතුමිණි දිල්ෂාණි මෙනවිය
6. ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.එච්. ගාමිණී මහතා
7. ගරු ප්‍රාදේශීය සභා සභික - ඩබ්.කේ. ටෂිත සමිල මහතා

| | | | |
|---|---|---|---|
| 8. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | එන්.ජී. සරත් මහතා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ජී.එච්.ජී. නීටා මිය |
| 10. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ආර්. රජිත ප්‍රියදර්ශන මහතා |
| 11. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | - | ප්‍රභාත් ලියනාරච්චි මහතා |
| 12. | ලේකම් | - | ඩී. රුවිනා දීපානි මිය |
| 13. | ප්‍ර.කළමනාකරණ සේවා නිලධාරී | - | කේ.එන්.ජී. ප්‍රමිලා නදීෂිකා මහතා |
| 14. | සංවර්ධන නිලධාරී | - | ටී.එච් සචිත්‍රා ප්‍රසාදනී මිය |
| 15. | සංවර්ධන නිලධාරී | - | ඒ.එම් ගීතාංජලී ධනුෂ්කා මිය (කමිටුලේකම්) |
| 16. | සංවර්ධන නිලධාරී | - | එල්.පී. කල්පනී චමින්දිකා මිය |
| 17. | සංවර්ධන නිලධාරී | - | ඩබ්.ඒ. අසංගිකා මිය |
| 18. | තාක්ෂණ සේවා නිලධාරී | - | එල්.පී. ජගත් කුමාර මහතා |
| 19. | කළමනාකරණ සේවා නිලධාරී | - | බී.ඒ. සුරේෂි මධුෂාණි මෙනවිය |
| 20. | කළමනාකරණ සේවා නිලධාරී | - | සඳුනි නරසිංහගේ මෙනවිය |
| 21. | ආදායම් පරීක්ෂක | - | එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මෙනවිය |
| 22. | කළමනාකරණ සේවා නිලධාරී | - | බී.කේ. ධම්මික සම්පත් මහතා |
| 23. | ප්‍රාදේශීය පරිසර නිලධාරී | - | ඊ.ජී.ඒ.ජී. මුණිදාස මහතා |
| 24. | පොලිස් පරිසර නිලධාරී | - | ඩී.යූ ජාගොඩ මහතා |
| 25. | සාමාජික | - | යූ.කේ.ඩී. වික්‍රමරත්න මහතා |
| 26. | ස්ථාන භාරකරු (කොම්පෝස්ට්) | - | සුනිල් විතාරණගේ මහතා |
| 27. | වැඩ පරිපාලක (වැ/බල) | - | චමින්ද කොඩිතුවක්කු මහතා |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, ප්‍රභාත් ලියනාරච්චි මහතා පරිසර කමිටුවේ සාමාජිකයෙකු ලෙස නම් කර ඇති නිසා, එතුමන් පරිසර කමිටුවට අනිවාරයෙන්ම සහභාගී විය යුතු බැවින්, මාසිකව පැවැත්වෙන පරිසර කමිටුව සඳහා සහභාගී වන ලෙසට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ලිපියක් මගින් දන්වා යවන ලෙසට විෂය නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.</u>

<u>ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ ඉල්ලීම පරිදි එතුමන්ද පරිසර කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කර ගන්නා ලෙසටත් විෂය නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

11. 2023 වර්ෂයේ නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | - | ඩබ්.ජී. උපුල් මහතා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ඩබ්.කේ. ටෂිත සමිල මහතා (කමිටු සභාපති) |
| 3. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | පී.එල්. චාලි ගුණරත්න මහතා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | පී.කේ. ආරියසේන මහතා |
| 6. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවිය |
| 7. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | කේ.එච්. ගාමිණි මහතා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ආර්. රජිත ප්‍රියදර්ශන මහතා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ජී.එච්.ජී. නීටා මහත්මිය |
| 10. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ඒ.පී. ධම්මික මහතා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ආර්.කේ.එම්. රෝහිත මහතා |
| 12. | ගරු ප්‍රාදේශීය සභා සභික | - | ඒ.ඩබ්. නන්දා මහත්මිය |
| 13. | ලේකම් | - | ඩී. රුවිනා දීපානි මහත්මිය |
| 14. | ප්‍ර.කළමනාකරණ සේවා නිලධාරී | - | කේ.එන්.ජී. ප්‍රමිලා නදීෂිකා මිය |

15. ප්‍රජා සංවර්ධන නිලධාරී - ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මිය (කමිටු ලේකම්)
16. සංවර්ධන නිලධාරී - එල්.පී. කල්පනී චමින්දිකා මිය
17. සංවර්ධන නිලධාරී - ඒ.එම්. ගීතාංජලී ධනුෂ්කා මිය
18. සංවර්ධන නිලධාරී - ඩබ්.ඒ.අසංගිකා මිය
19. තාක්ෂණ සේවා නිලධාරී - එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය
20. කළමනාකරණ සේවා නිලධාරී - බී.ඒ. සුරේෂි මධුෂාණි මෙනවිය
21. කළමනාකරණ සේවා නිලධාරී - සදුනි නරසිංහගේ මෙනවිය
22. කළමනාකරණ සේවා නිලධාරී - බී.කේ. ධම්මික සම්පත් මහතා
23. සෞඛ්‍ය පරිපාලක (වැ/බ) - චමින්ද කොඩිතුවක්කු මහතා
24. අපේක්ෂක - එස්.එම්. නසීර් මහතා
25. අපේක්ෂිකා - නිර්මලා ප්‍රියන්ති පියදිගම මහත්මිය
26. ගෘහ නිර්මාණ ශිල්පී - අමරසේන අලහප්පෙරුම මහතා
27. කමිටු සාමාජික - ඩබ්.ඒ. සුදත් හේමන්ත මහතා
28. කමිටු සාමාජික - යූ.කේ.ඩී.වික්‍රමරත්න මහතා

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. පරිසර විෂයට අදාළ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද පරිසර අංශයේ වාර්ෂික සැලැස්ම හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2027 |
|---|---|---|---|---|---|---|
| 1 | පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ අනුමත කරන ලද සැලසුම් අනුව කසළ එකතු කිරීමට සේවකයන් යෙදවීම හා දිරන නොදිරන ලෙස වෙන් කළ කසළ විධිමත් පරිදි එකතු කිරීම | පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ අනුමත කරන ලද සැලසුම් අනුව කසළ එකතු කිරීමට සේවකයන් යෙදවීම හා දිරන නොදිරන ලෙස වෙන් කළ කසළ විධිමත් පරිදි එකතු කිරීම | පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ අනුමත කරන ලද සැලසුම් අනුව කසළ එකතු කිරීමට සේවකයන් යෙදවීම හා දිරන නොදිරන ලෙස වෙන් කළ කසළ විධිමත් පරිදි එකතු කිරීම | පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ අනුමත කරන ලද සැලසුම් අනුව කසළ එකතු කිරීමට සේවකයන් යෙදවීම හා දිරන නොදිරන ලෙස වෙන් කළ කසළ විධිමත් පරිදි එකතු කිරීම | පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ අනුමත කරන ලද සැලසුම් අනුව කසළ එකතු කිරීමට සේවකයන් යෙදවීම හා දිරන නොදිරන ලෙස වෙන් කළ කසළ විධිමත් පරිදි එකතු කිරීම | පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ අනුමත කරන ලද සැලසුම් අනුව කසළ එකතු කිරීමට සේවකයන් යෙදවීම හා දිරන නොදිරන ලෙස වෙන් කළ කසළ විධිමත් පරිදි එකතු කිරීම |
| 2 | ව්‍යාපාරික ස්ථාන වලින් වෙන් කළ කසළ එකතු කිරීම අඛණ්ඩව සිදු කිරීම | ව්‍යාපාරික ස්ථාන වලින් වෙන් කළ කසළ එකතු කිරීම අඛණ්ඩව සිදු කිරීම | ව්‍යාපාරික ස්ථාන වලින් වෙන් කළ කසළ එකතු කිරීම අඛණ්ඩව සිදු කිරීම | ව්‍යාපාරික ස්ථාන වලින් වෙන් කළ කසළ එකතු කිරීම අඛණ්ඩව සිදු කිරීම | ව්‍යාපාරික ස්ථාන වලින් වෙන් කළ කසළ එකතු කිරීම අඛණ්ඩව සිදු කිරීම | ව්‍යාපාරික ස්ථාන වලින් වෙන් කළ කසළ එකතු කිරීම අඛණ්ඩව සිදු කිරීම |
| 3 | පාසල් ගෙවතු සංවර්ධනය කිරීම | පාසල් ගෙවතු සංවර්ධනය කිරීම | පාසල් ගෙවතු සංවර්ධනය කිරීම | පාසල් ගෙවතු සංවර්ධනය කිරීම | පාසල් ගෙවතු සංවර්ධනය කිරීම | පාසල් ගෙවතු සංවර්ධනය කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | කසළ දාහකයේ වැඩ කටයුතු සිදු කිරීම | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කොට්ඨාස මට්ටමින් ඩෙංගු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කොට්ඨාස මට්ටමින් ඩෙංගු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කොට්ඨාස මට්ටමින් ඩෙංගු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කොට්ඨාස මට්ටමින් ඩෙංගු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 5 | පොළවල් වළ කසළ එකතු කිරීමේ දී වෙළඳුන්ගේ කසළ වෙළඳාම අවසන් වූ පසු, කඩ අල්ලියේම වෙන් කර තැබීමට දැනුවත් කිරීම | කසළ දාහකයේ වැඩ නිම කිරීම | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 6 | හඳුනා ගත් ප්‍රධාන මාලු වෙළඳසැල් ප්‍රාදේශීය සභාවේ විධිමත් සැලැස්මකට අනුව ක්‍රියාත්මක කිරීම හා අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් පිරිදි සිදු කිරීම | කසළ අවසන් බැහැර කිරීම විධිමත් කිරීම | අවසන් බැහැර කිරීම කරනු ලබන කසළ දාහකය මගින් පිළිස්සීමේ කටයුතු සිදු කිරීම | අවසන් බැහැර කිරීම කරනු ලබන කසළ දාහකය මගින් පිළිස්සීමේ කටයුතු සිදු කිරීම | අවසන් බැහැර කිරීම කරනු ලබන කසළ දාහකය මගින් පිළිස්සීමේ කටයුතු සිදු කිරීම | අවසන් බැහැර කිරීම කරනු ලබන කසළ දාහකය මගින් පිළිස්සීමේ කටයුතු සිදු කිරීම |
| 7 | කාබනික දියර පොහොර සකස් කිරීම සඳහා මුලික සැලැස්ම සකස් කිරීම | කාබනික පොහොර භාවිතයෙන් රුක් රෝපණ වැඩ සටහන් ආරම්භ කිරීම | කසළ අවසන් බැහැර කිරීම විධිමත් කිරීම | කසළ අවසන් බැහැර කිරීම විධිමත් කිරීම | කසළ අවසන් බැහැර කිරීම විධිමත් කිරීම | කසළ අවසන් බැහැර කිරීම විධිමත් කිරීම |
| 8 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති කසළ වත්තේ ඉඩම් කොටසේ කසළ අවසන් බැහැර කිරීම විධිමත් කිරීමට ගලි අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධතියක් හා සනිපාරක්ෂක බිම් පිරවුම් ඒකකයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය මුලික කටයුතු සිදු කිරීම | නගරයේ කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කර, ක්‍රමවත්ව පවත්වාගෙන යාම | නගරයේ විශේෂිත උත්සව අවස්ථාවලදී කසළ බැහැර කිරීමට විශේෂිත අවස්ථා හඳුන්වා දීම | නගරයේ විශේෂිත උත්සව අවස්ථාවලදී කසළ බැහැර කිරීමට විශේෂිත අවස්ථා හඳුන්වා දීම | නගරයේ විශේෂිත උත්සව අවස්ථාවලදී කසළ බැහැර කිරීමට විශේෂිත අවස්ථා හඳුන්වා දීම | නගරයේ විශේෂිත උත්සව අවස්ථාවලදී කසළ බැහැර කිරීමට විශේෂිත අවස්ථා හඳුන්වා දීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9 | කොට්ඨාස මට්ටමින් ඩෙංගු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | පොදු වැසිකිළි පද්ධති නඩත්තුව හා පිරිසිදු කිරීම | කාබනික පොහොර හා දියර පොහොර භාවිතයෙන් රුක් රෝපණ වැඩ සටහන් ආරම්භ කිරීම | කාබනික පොහොර හා දියර පොහොර භාවිතයෙන් රුක් රෝපණ වැඩ සටහන් ආරම්භ කිරීම | කාබනික පොහොර හා දියර පොහොර භාවිතයෙන් රුක් රෝපණ වැඩ සටහන් ආරම්භ කිරීම | කාබනික පොහොර හා දියර පොහොර භාවිතයෙන් රුක් රෝපණ වැඩ සටහන් ආරම්භ කිරීම |
| 10 | නගරයේ කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කර, ක්‍රමවත්ව පවත්වාගෙන යාම | ආගමික ස්ථානවල කසළ වෙන් කර ලබා ගැනීම | පොදු වැසිකිළි පද්ධති නඩත්තුව හා පිරිසිදු කිරීම | පොදු වැසිකිළි පද්ධති නඩත්තුව හා පිරිසිදු කිරීම | පොදු වැසිකිළි පද්ධති නඩත්තුව හා පිරිසිදු කිරීම | පොදු වැසිකිළි පද්ධති නඩත්තුව හා පිරිසිදු කිරීම |
| 11 | පොදු වැසිකිළි පද්ධති නඩත්තුව හා පිරිසිදු කිරීම | මාලු වෙළඳසැල්වල අපද්‍රව්‍ය වෙන් කර ලබා ගැනීම | ආගමික ස්ථානවල කසළ වෙන් කර ලබා ගැනීම | ආගමික ස්ථානවල කසළ වෙන් කර ලබා ගැනීම | ආගමික ස්ථානවල කසළ වෙන් කර ලබා ගැනීම | ආගමික ස්ථානවල කසළ වෙන් කර ලබා ගැනීම |
| 12 | | නගරයේ විශේෂිත උත්සව අවස්ථාවලදී කසළ බැහැර කිරීමට විශේෂිත අවස්ථා හඳුන්වා දීම | මාලු වෙළඳසැල්වල අපද්‍රව්‍ය වෙන් කර ලබා ගැනීම | මාලු වෙළඳසැල්වල අපද්‍රව්‍ය වෙන් කර ලබා ගැනීම | මාලු වෙළඳසැල්වල අපද්‍රව්‍ය වෙන් කර ලබා ගැනීම | මාලු වෙළඳසැල්වල අපද්‍රව්‍ය වෙන් කර ලබා ගැනීම |
| 13 | | කැම්ප් සයිඩ්වල කසළ විධිමත් ලෙස ලබා දීමට දැනුවත් කිරීම හා නීතිගරුක නොවුවන් සඳහා පොලිස් පරිසර ඒකකයේ සහයෝගයෙන් නීතිමය කටයුතු සිදු කිරීම කාබනික දියර පොහොර සකස් කිරීම සඳහා මූලික සැලැස්ම සකස් කිරීම | කාබනික දියර පොහොර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම | කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ක්‍රමවත්ව කසළ අවසන් බැහැර කිරීම සිදු කිරීම හා ක්‍රමවත්ව ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම | ක්‍රමවත්ව කසළ අවසන් බැහැර කිරීම සිදු කිරීම හා ක්‍රමවත්ව ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ප්‍රාදේශීය සභාවේ කිසිදු කසළ ට්‍රැක්ටරයක් කසළ වත්තේ කුණු බැහැර නොකරන අතර, සියලුම කසළ කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ තෝරා කොම්පෝස්ට් පොහොර නිපදවීමේ කටයුතු සිදු කරනු ලබයි. කසළ පරිසරයට එක් කර පරිසරය හානිවන පරිදි කිසිදු දෙයක් සිදු නොකල යුතුය. එම නිසා මේ සම්බන්ධයෙන් පරිසර කමිටු සභාපති, ගරු උප සභාපති සුදත් විදානමගේ මහතාගේ අධීක්ෂණය</u>

යටතේ මේ සම්බන්ධයෙන් විෂය වෙතින් වාර්තාවන් ලබා ගැනීමට කටයුතු සිදු කරන ලෙසටත්, පිටත වාහන කසළ පරිසරයට මුදාර හැරීම පිළිබඳව සොයා බලා එය නතර කරවීමට වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බවටත් දන්වා සිටින ලදී.

තවද, බොහෝ දුරට පරිසරයට කසළ මුදා හරිනු ලබන්නේ කැම්ප් සයිඩ් වලින් බවට තොරතුරු දැන ගැනීමට ලැබී ඇති බැවින්, කැම්ප් සයිඩ් වලට සහ ජීප් සංගම් 03 සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සාකච්ඡාවක් ලබා ගැනීමට ඔවුන් වෙත ලිපියක් මගින් දන්වා යවන ලෙසට විෂය නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. 2023 වර්ෂයේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සඳහා පහත සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

1. ගරු සභාපති - ඩබ්.ජී. උපුල් මහතා (කමිටු සභාපති)
2. ගරු උප සභාපති - සුදත් විදානගමගේ මහතා
3. ගරු ප්‍රාදේශීය සභා සභික - ඩබ්.කේ. ටෂිත සමිල මහතා
4. ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා
5. රු ප්‍රාදේශීය සභා සභික - පී.කේ. ආරියසේන මහතා
6. ගරු ප්‍රාදේශීය සභා සභික - චතුමිණී දිල්ෂාණි විජේනායක මෙනවිය
7. ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.කේ.එම්. රෝහිත මහතා
8. ගරු ප්‍රාදේශීය සභා සභික - ඩබ්.කේ. සිසිර කුමාර මහතා
9. ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.එච්. ගාමිණී මහතා
10. ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්. රජිත ප්‍රියදර්ශන මහතා
11. ලේකම් - ඩී. රුවිනා දීපානි මිය
12. ප්‍රධාන කළමනාකරණ සේවා නිළධාරී - කේ.එන්.ජී.ප්‍රමිලා නදීෂිකා මිය
13. සංවර්ධන නිළධාරී - එල්.පී.කේ.චමින්දිකා මිය
14. සංවර්ධන නිළධාරී - ඩබ්.ඒ. අසංගිකා මිය
15. සංවර්ධන නිළධාරී - ටී.එච්.සවිත්‍රා ප්‍රසාදිනී මිය
16. සංවර්ධන නිළධාරී - ඒ.එම්.ගීතාංජලී ධනුෂ්කා මිය
17. තාක්ෂණ සේවා නිළධාරී - එල්.පී. ජගත් කුමාර මහතා
18. තාක්ෂණ සේවා නිළධාරී - එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය
19. කළමනාකරණ සේවා නිළධාරී- බී.ඒ.එස්.මධුෂාණි මෙනවිය
20. කළමනාකරණ සේවා නිළධාරී- බී.කේ.ධම්මික සම්පත් මයා
21. කළමනාකරණ සේවා නිළධාරී - ආර්.කේ.චමිලා මධුවන්ති මිය
22. ආදායම් පරීක්ෂක - එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මිය
23. කමිටු සාමාජික - යූ.කේ.ඩී. වික්‍රමරත්න මහතා
24. කමිටු සාමාජික - එම්.හර්ෂ කුමාර මුණසිංහ මහතා
25. කමිටු සාමාජික - සනත් කොඩිතුවක්කු මහතා

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

14. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට වීරවිල ගම්සභා අසළ පිහිටි නිල නිවාස සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022.10.14 දිනැතිව **HT/RG/1021** දරණ අංකය යටතේ යොමුකර ඇති තක්සේරු වාර්තාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

| නිළ නිවාස අංකය | පැරණි මාසික තක්සේරු වටිනාකම | නව මාසික තක්සේරු වටිනාකම |
|---|---|---|
| අංක 02 | රු. 1,800.00 | රු.2,475.00 (රු. දෙදහස් හාරසීය හැත්තෑ පහක් පමණි.) හෝ |
| | | ආයතන සංග්‍රහයේ **xix 5.3** අනුව අදාළ නිලධාරීයාගේ වැටුපෙන් 12.5% ක් අයකිරීමට |

(2022.10.14 දිනැතිව HT/RG/1021 දරණ අංකය යටතේ යොමුකර ඇති තක්සේරු වාර්තාව මේ සමඟ අමුණා ඇත.)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. 2023 වර්ශයේ ටෙන්ඩර් දේපල බදු දීම සඳහා දෙවන වර ටෙන්ඩර් පත් විවෘත කිරීම 2022/11/10 වන දින පෙ.ව 10.30ට තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේදී පැවැති අතර ටෙන්ඩර් නොවූ දේපළ 06ක් සඳහා ටෙන්ඩර් කැඳවීම සිදුකර ඉන් එක් දේපළකට පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කර තිබුණි.

| | ටෙන්ඩර් ද්පළයේ නම | අවම ලංසු මුදල | ටෙන්ඩරය ඉල්ලුම්කර ඇති මුදල |
|---|---|---|---|
| 01 | දෙබරවැව පොදු වෙළඳපොළ හා වැසිකිළිය (වි.ඒ රංජිත් මයා) | 2078181.81 | 2079581.00 |

ඉතිරි ටෙන්ඩර් නොවූ දේපළ 05 සඳහා ටෙන්ඩර් ප්‍රසම්පාදන කමිටුව රැස්වූ අතර එහිදී එම දේපල සඳහා අවම ලංසු මුදලින් 10% අඩු කර තෙවන වර ප්‍රාදේශිය ටෙන්ඩර් පටිපාටිය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

| | ටෙන්ඩර් ද්පළයේ නම | අවම ලංසු මුදල (දෙවන වර) | 10% අඩු කළ පසු අවම ලංසු මුදල |
|---|---|---|---|
| 01 | කිරින්ද පූජානගර රථවාහන නැවතුම්පොළ | 1207710.00 | 1086939.00 |
| 02 | දෙබරවැව ධීවර වෙළඳසැල | 120,000.00 | 108000.00 |
| 03 | දෙබරවැව පොදු වෙළඳපොළ ධීවර ගොඩනැගිල්ල | 162000.00 | 145800.00 |
| 04 | අකුරුගොඩ හංදීයේ වැසිකිළිය | 3168.00 | 2851.20 |
| 05 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එලදාව (පොල් ගස් 07) | 2250.00 | 2025.00 |

ඒ අනුව ඉහත ටෙන්ඩර් කමිටුවේ තීරණ, ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 3/2/පොදු අංක දරණ 2022.10.26 දිනැති ලිපියට අනුව, පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව එක් එක් පළාත් පාලන ආයතනවලට අදාළව දැනට

පවතින දැක්ම හා මෙහෙවර වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සකස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**දැක්ම**

සෞභාග්‍යයේ දැක්ම හේතු කොට ගෙන ජන සහභාගීත්ව සංකල්පය තුළින් ශ්‍රී ලංකාවේ කාර්යක්ෂම තිරසාර සමෘද්ධිමත් අග්‍රගණ්‍ය ප්‍රාදේශීය සභාව බවට පත් කිරීම

**මෙහෙවර**

වාරි සංස්කෘතිය පෙරටු කර ගත් කෘෂි ආර්ථිකයක් පණ පෙවූ දියුණු සංස්කෘතියකට උරුමකම්පාන පෞරාණික මාගම්පුර රාජධානියේ ගිරුවාපත්තුව නම ලද තිස්ස නගරය කේන්ද්‍ර කර ගත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය එහි ජීවත් වන ජනතාවටත්, දෙස් විදෙස් සංචාරකයින්ගේ සෞඛ්‍ය, සුභ සාධනය, පොදු උපයෝගීතා සේවාවන් කාර්යක්ෂමව හා විධිමත් පරිදි පරිපාලනය කරමින් තිරසර සමෘද්ධිමත් පුරවරයක් ලෙස ගොඩනැගීම අපගේ මෙහෙවරයි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. 2023 වර්ෂයේ සැලසුම් කමිටුව සඳහා පහත නම් සඳහන් සාමාජිකයන් පත් කිරීමට සුදුසු බව ගරු මහා සභාවට යෝජනා කරමි.

| නම | තනතුර |
|---|---|
| 1. ඩබ්.ජී.උපුල් මයා | - සභාපති |
| 2. ඩී.රුවිනා දීපානි මිය | - ලේකම් |
| 3. එම්.ප්‍රියන්ති මිය | - සැලසුම් නිලධාරී(නාගරික සංවර්ධන අධිකාරිය) |
| 4. එල්.පී.ජගත් කුමාර | - තාක්ෂණ සේවා නිලධාරී |
| 5. එම්.ඩබ්.පී.චතුරිකා | - තාක්ෂණ සේවා නිලධාරී |
| 6. ඩබ්ලිව්.ඒ.අසංගිකා | - සංවර්ධන නිලධාරී |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**

- **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

18. 2022 වර්ෂය සඳහා පහත සඳහන් ටෙන්ඩර් දේපළ වෙනුවෙන් ජූලි සහ අගෝස්තු මාස සඳහා බදු සහන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව, 2022.10.19 දින මහා සභාවේ තීරණ අංක 19 යටතේ අදායම් පරීක්ෂකගේ වාර්තා සමග ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර, එක් එක් දේපළයන් සඳහා ලබා දෙන බදු සහන මුදල, ගරු මහා සභාවේ තීරණය කර, අදාළ අනුමැතිය සඳහා යැවීම සුදුසු බවට සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපළ විස්තරය | මාසික බදු වාරික මුදල (රු) | ජූලි ,අගෝසතු මාස සඳහා මුළු වාරික මුදල | කපා හැරීම සඳහා යොජනා කරන ලද මුදල 50% |
|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 137,000.00 | 274000.00 | 137,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | 173,181.82 | 346363.64 | 173,181.82 |
| 03 | කිරින්ද පූජා නගර පැරණි හා නව වැසිකිළිය | 9,000.00 | 18000.00 | 9.000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 1,270.84 | 2541.68 | 1,270.84 |
| 05 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | 13,808.34 | 27616.68 | 13,808.34 |
| 06 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 11,492.50 | 22985.00 | 11,492.5 |
| 07 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 325.00 | 650.00 | 325 |
| 08 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 41,323.50 | 82647.00 | 41,323.5 |
| 09 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 100,642.50 | 201285.00 | 100,642.50 |
| | එකතුව | 488,044.5 | 976,089.00 | 488,044.5 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

ඉහත සඳහන් ටෙන්ඩර් දේපළ වෙනුවෙන් ජූලි සහ අගෝස්තු මාස සඳහා බදු සහන ලෙස මාසික වාරික මුදලින් 50% ක් බදු සහන ලබා දීම සුදුසු බවට මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

19. තිස්සමහරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කල ප්‍රදේශ වශයෙන් හදුනාගත් පහත සදහන් මාර්ගයන් දෙපස පිහිටි දේපල වලින් වරිපනම් බදු අයකර ගැනීමට වරිපනම් බදු පැනවීමට ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියට අනුව කටයුතු කිරීමට සුදුසු බවට මහ සභාවට යෝජනා කරමි.

I. තිස්සමහරාම වැල්ලවාය පාර කිරිදිඹය පාලම අසල සිට පන්නගමුව තුම්මන් හංදිය ඇල්ලගල හංදිය (වීරවිල වැල්ලවාය පාරට සම්බන්ධ වන ස්ථානය) දක්වා වූ ප්‍රධාන මාර්ගය දෙපස අයත්වන පරිදි,

II. තිස්සමහරාම කතරගම පාර අකුරුගොඩ මැදවච ඇල අසල සිට ජුල්පල්ලම කිරිදිඹය වම් ඉවුර ප්‍රධාන ඇල දක්වා වූ මාර්ගය දෙපස අයත් වන පරිදි,

III. තිස්සමහාරාම රබර්වත්ත පාර දුම්කොල ඇල අසල (තිස්ස වැව ගොඩ දොර ඇල රබර්වත්ත පාර හරහා ගමන් කරන ස්ථානය අසල) සිට රබර්වත්ත පාර දෙබරවැව - හම්බන්තොට මාර්ගයට සම්බන්ධවන ස්ථාය දක්වා ප්‍රධාන මාර්ග දෙපස අයත් වන පරිදි,

IV. තිස්සමහාරාම කච්චේරියගම අලුත්ගොඩ පාර ගොඩදොර ඇල මාර්ගය දක්වා ගමන් කරන ස්ථානය, ඒකී මාර්ගය දෙබරවැව - හම්බන්තොට ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන ස්ථානය දක්වා වූ මාර්ගය දෙපස අයත් වන පරිදි,

V. යෝධකණ්ඩිය උපනගරය වැලිපොතේවල පාර ආරම්භ වන මන්සන්ධියේ සිට කිරින්ද නගරය නිදන්ගල වැල්ල දක්වා මාර්ගය අයත් වන පරිදි,

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

2023 වසරේ සිට වරිපනම් දියුණු කළ ප්‍රදේශය නම් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. යම් ඉඩමක් ගොඩනැගිල්ලක් සඳහා වරිපනම් බදු ගෙවන්නේ නම්, එම ඉඩමට සහ ගොඩනැගිල්ලට වටිනාකමක් එකතු වනු ඇත. දියුණු කළ ප්‍රදේශය ලෙස නම් කර වරිපනම් බදු ගෙවන්නේ නම් එය ජනතාවට ලැබෙන වාසියක් වනු ඇත. එම නිසා මෙම යෝජනාව 2023 වසරේ ක්‍රියාත්මක කිරීම සුදුසු වන බව දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට පවරා දී ඇති වීරවිල හන්දියේ පිහිටි නව කඩ කාමර තුනෙහි වැඩ අවසන් කර ඇති අතර, සුදුසු බදුකරුවන් හට ලබා දීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නියමිත තක්සේරුවක් ලබා ගැනීමට යොමු කොට ඇත. එතෙක් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති තාවකාලික තක්සේරුව වන එක් කඩ කාමරයක් රු. 300.00 ක මුදලක් අය කොට සංශෝධනයන්ට යටත්ව සුදුසු බදුහිමියන්ට ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. තිස්සමහාරාම බල ප්‍රදේශය තුළ පිහිටි වෙරළ උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා කිරින්ද වෙරළ රක්ෂිත සීමාව මැනුම් කර දෙන මෙන් ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් සිදු කළ අතර එහිදි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත මැනුම් නියෝගයක් ඉදිරිපත් කළ විට මිනින්දෝරු අධිකාරී විසින් මැනුම් ගාස්තුව ලෙස රු.149500.00 ක මුදලක් වැය වන බව දන්වා ඇත. මෙම භූමිය රජයෙන් මැනුම් කටයුතු සිදු කර ඇති බැවින් එම මිනින්දෝරු සැලැස්ම ලබා දෙන ලෙස ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී වෙත ඉල්ලීමක් ද අප විසින් සිදු කර ඇති අතර, එය ලබා ගත නොහැකි වුවහොත් ආදායම් උපදවන මෙම සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන භූමිය මැනුම් කිරීමට ගෙවිය යුතු මැනුම් ගාස්තුව වන රු.149500.00 ක මුදල ගෙවීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහසභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>

අඳගලවැල්ල සංවර්ධනය කර සභාවට ආදායමක් ලබා ගත හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකසා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන තිස්සමහාරාම හා යෝධකණ්ඩිය නිදහස් ආයුර්වේද මධ්‍යස්ථාන සඳහා ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් බිල්පත් අංක 7ICR012819 / 7ICR012821 යටතේ රු. 299,978.00 ක මුදල ගෙවීම් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

23. රට තුල පවතින තත්ත්වය තුල ගෑස් සහ ඉන්ධන ඇතුළු අනෙකුත් භාණ්ඩවල මිල සීඝ්‍රයෙන් ඉහල යාම හේතුකරගෙන 2022 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වසර අවසන් වීමට ප්‍රථම අවසන් වී ඇති බැවින් ඉදිරි මාස 1 ½ කාලය සඳහා වියදම් දැරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත වියදම් හා ඇස්තමේන්තුගත ආදායම් අනුමත කර ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ආදායම් ඇස්තමේන්තුව**

| අය විෂය සංකේතය | අය විෂය නාමය | ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|
| 1-63 | මුද්දර ගාස්තු | 3,900,000.00 |
| 2-31 (1%) | වෙළඳ බලපත්‍ර (1%) | 1,000,000.00 |
| | | |
| | | 4,900,000.00 |

වියදම් ඇස්තමේන්තුව

| වැය විෂය සංකේතය | වැය විෂය නාමය | ඇස්තමේන්තු මුදල (රු.) |
|---|---|---|
| 103-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 500,000.00 |
| 203-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 1,000,000.00 |
| 303-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 500,000.00 |
| 503-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 200,000.00 |
| 603-2 | ඉන්ධන හා ස්නේහක තෙල් | 300,000.00 |
| 203-8-1 | ගෑස් මිලදී ගැනීම | 400,000.00 |
| 103-8 | වෙනත් ගබඩා භාණ්ඩ | 100,000.00 |
| 103-1 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 245,000.00 |
| 203-8 | වෙනත් ගබඩා භාණ්ඩ | 200,000.00 |
| 104-1-1 | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 300,000.00 |
| 104-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 50,000.00 |
| 204-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 50,000.00 |
| 504-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 1,000,000.00 |
| 604-1 | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 50,000.00 |
| | | 4,895,000.00 |
| | අතිරික්තය(4900000-43895000) | 5,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. තිස්සමහාරාම වැව් කණ්ඩියේ වාහන නැවතුම්පොළ සකස් කිරීම සඳහා සකස් කළ රු. 615,950.24 කින් යුත් ඇස්තමේන්තුව, සෘජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් සිදු කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ <u>**රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**</u>

- <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මිය**</u>

25. නැදිගම්විල කිරිදිඹය ගඟ හරහා සකස් කර ඇති වැල් පාළම ඉතාමත් පැරණි පාළමකි. මෙම පාළම මගින් ගම් 02 ක ජනතාව ගඟෙන් එගොඩ සිට මෙගොඩට ගමන් පහසුකම් ලබා ගනු ලැබුවද, මෙම පාළම දැනට බොහෝ අබලන් තත්ත්වයේ පවතින බැවින්, ජනතාවගේ ගමන් පහසුකම තව දුරටත් ඔවුන්ට ලබා ගැනීම සඳහා මෙම වැල් පාළම අලුත්වැඩියා කර දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

නැදිගම්විල ප්‍රදේශයේ ගම් 02 ක් යා වන පරිදි එම ගම්වල ජනතාවගේ ගමන් පහසුකම ලබා ගැනීම සඳහා ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම මත චමල් රාජපක්ෂ අමුණ සකස් කර ඇත. නමුත් එම ප්‍රදේශයේ පවතින වැල් පාළම ද දැනටත් භාවිතා කරනු ලබයි. වැල් පාළම ඉතාමත් පෞරාණික පාළමකි. එම නිසා මෙම පාළම ප්‍රතිසංස්කරණය කර පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, පෞරාණිකත්වය රැකෙන පරිදි යම් වැඩපිළිවෙලක් සකස් කර ගැනීම සුදුසු බව දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

26. යෝධකණ්ඩිය හ/ ශ්‍රී දේවානන්ද ජාතික පාසලේ ළමුන් 1500 ක් පමණ අධ්‍යාපන ලබන අතර, එම ළමුන් සඳහා වොලිබෝල් ක්‍රීඩා පිටියක් නොමැති බැවින්, ක්‍රීඩා කරන ළමයින්ගේද පාසල් සංවර්ධන කමිටුව, ආදි ශිෂ්‍ය සංගමය, විදුහල්පතිතුමා ප්‍රධාන ක්‍රීඩා ගුරුවරුන්ගේ ඉල්ලීම පරිදි යෝධකණ්ඩිය රුහුණු පින්සර ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩා මණ්ඩපය ඉදි කිරීමට සූදානම් වන බැවින්, ඒ සඳහා වොලිබෝල් ක්‍රීඩා පිටියේ භූමිය සකස් කර ගැනීම සඳහා ඉන්ධන ලබා දීමේ පදනම මත ජේ.සී.බී. යන්ත්‍රය ලබා දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
    එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

27. යෝධකණ්ඩිය උද්ධකන්දර වැවේ යාය ප්‍රදේශයේ 1980 දශකයේ ආරම්භ කර රජයේ මැදිහත්වීම මත කිහිපවතාවක් ලක්ෂ සියයකට අධිකව මුදල් යොදා ගොවි පවුල් 48 කට පමණ කුඹුරු අක්කර ½ බැගින් ලබා දී ඇති අතර, සියඹලාගස්වැව පෝෂක ජල මාර්ග හරස් කර පුද්ගලික ව්‍යාපාර මට්ටමේ පුද්ගලයින් කුඩා වැව් අනවසරයෙන් ඉදි කර තිබීම නිසා, අවසරලත් ගොවීන්ට වගා කිරීමේදී ජලට ගැටළුවට මුහුණ දීමට සිදු වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලා අදාළ ආයතන දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

    එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>**

උද්ධකන්දර මහදෙයිර සියඹලාගස්වැව ගරු සභික, චාලි ගුනවර්ධන මහතාගේ මැදිහත්වීම මත දේශපාලන අධිකාරිය මගින් ප්‍රතිපාදන ලබා ගනිමින් සකස් කර ඇති වැවකි. ඒ අවට පවුල් කිහිපයක් ගොවිතැන් කටයුතු කරමින් ඉතාමත් සාධාරණ ලෙස තම ජීවිකාව ගෙන යනු ලබන බැවින්, මෙම ගොවීන්ට ගොවිතැන් කටයුතු කිරීම සඳහා ජලය ලබා ගන්නා ජල පෝෂක මාර්ග හරස් කරමින් පුද්ගලික ව්‍යාපාර මට්ටමේ පුද්ගලයින් කුඩා වැව් අනවසරයෙන් ඉදි කර ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

තවද, සියඹලාගස්වැව සකස් කිරීම සඳහා දැඩි මැදිහත්වීමක් සහ දායකත්වයක් ලබා දුන් අප සභාව නියෝජනය කරන ගරු සභික, චාලි ගුණරත්න මහතා වෙත එතුමන් සිදු කළ සේවාවට ස්තුතිය පුද කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, චාලි ගුණරත්න මහතා</u>**

සියඹලාගස්වැව ඉතාමත් පැරණි වැවකි. මෙම වැවේ ආර හරස් කර වැව් කාවේ කුඩා වැව් කණ්ඩි ඉදි කිරීමෙන් ගොවිතැන් කරන ගොවි ජනතාවගේ වගාවන් සඳහා අවශ්‍ය කරන ජල පෝෂක මාර්ග හරස් කර ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අදාළ ආයතනයන් වෙත දන්වා මෙකී කාර්යය සම්පූර්ණයෙන්ම නවතා දැමිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සියඹලාගස්වැව හරස් කරමින් කුඩා වැව් ඉදි කර ඇති පුවත සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, පොලිස් ස්ථාන හා මාධ්‍යවේදීන් ඒක්ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර, මේ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙසට ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.11.03 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.11.03 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.11.03 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.11.03 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**(උ) වෙනත් කරුණු**

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>

වන අලින් තවමත් ගම්වැදීම නතර වී නොමැත. ඉදි කර ඇති විදුලි වැටද කඩා දමමින් වන අලි ගම්වදී. මේ නිසා අප ප්‍රදේශයන්වල ජනතාවගේ වගා හානි සියල්ල හා දේපළ විනාශ කර දැමීම සිදු වී ඇත. මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කර මේ සදහා විසදුමක් ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

තම කොට්ඨාසයේ මාර්ග ගමන් කිරීමට නොහැකි ලෙසට අබලන් වී ඇති බැවින්, මෙකී මාර්ග හැකි අයුරින් හෝ සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

අප පාලන කාලය පුරාවටම ගව හිමියන් සඳහා විසඳුමක් ලබා ගැනීමට කතා කළද, අප කාලය අවසන් වීමට පැමිණියත්, ඒ සඳහා විසඳුමක් ලබා ගැනීමට නොහැකි වී ඇත. ගව හිමියන්ගේ ඉල්ලීම සඳහා තෘණ බිමක් ලබා දීමට අප ප්‍රදේශයේ යාල සහ බන්දු වැව ප්‍රදේශ පවතින බැවින්, මේ සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනයන් සමඟ සාකච්ඡා කර එම ප්‍රදේශයන්ගෙන් කොටසක් තෘණ භූමියක් සඳහා වෙන් කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

අප සභාවේ වාහන සර්විස් කිරීම සඳහා විශාල මුදලක් වැය වන නිසා, අප විසින්ම වැඩපිළිවෙලක් සකස් කර ගෙන ආයතනයේ වාහන සේදුම් මධ්‍යස්ථානයෙන් හැකි අයුරින් වාහන සේවා කර ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කර සිටින ලදී.

අප කොට්ඨාසයේ මාර්ග දෙපස ඇති ගස් මාර්ගය දෙසට නැමී ඇති බැවින්, මාර්ගය දෙපස සුද්ධ කර ගැනීම සඳහා ජේ.සී.බී. යන්ත්‍රය ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම**</u>

විහාරාමහාදේවීපුර ග්‍රාම නිලධාරී වසමේ ජනතාවගේ ජල අවශ්‍යතා සපුරා ගන්නා ලද නළ ළිදෙහි කොටසක් ගෙවී ඇති නිසා, ජලය ලබා ගැනීමට නොහැකි බැවින්, එය සකස් කර දෙන ලෙසට ජල සම්පාදන මණ්ඩලය වෙත දැන්වූ පසුව, මෙකී කරුණ ප්‍රාදේශීය සභාව හරහා ඉල්ලීම් කරන ලෙසට දැන්වූ බැවින්, මේ සම්බන්ධයෙන් දන්වා ජල සම්පාදන මණ්ඩලය වෙත ලිපියක් යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

කොරගහ උල්පත ගම්මානයේ තිබෙන නව ගම්මාන සඳහා පිවිසෙන මාර්ග ගමන් කිරීමට නොහැකි ලෙසට අබලන් වී ඇති බැවින්, ගමන් කිරීමට පහසු වන ලෙස මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

2023 අයවැය මගින් කාන්තා හා ළමා හිංසනය වැළැක්වීමේ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබීම ඉතාමත් හොඳ දෙයකි. මෙකී ප්‍රතිපාදන යොදා ගනිමින් 2023 වසරේ මෙම වැඩසටහන කොට්ඨාස 13 හිම සිදු කිරීමට වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

යෝධකණ්ඩිය විදුහල සඳහා වොලිබෝල් ක්‍රීඩාපිටියක් අවශ්‍යය. නමුත් පාසල අවට මිනිසුන් විසින් පාසලට අයත් භූමියද අත්පත් කර ගෙන ඇති බැවින්, එකී භූමි ප්‍රමාණයන්ද නැවත ලබා ගෙන මෙම ක්‍රීඩා පිටිය සකස් කිරීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

තම කොට්ඨාසයේ ද අලුත්වැඩියා කළ යුතු මාර්ග කිහිපයක් තිබෙන බැවින්, මෙම මාර්ග හැකි අයුරින් සකස් කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>කාන්තා හා ළමා හිංසනය පිළිබඳ වැඩසටහන් සංවිධානයට අවශ්‍ය කටයුතු සිදු කළ පසුව, ඒ සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය ලබා දිය හැකි බවත්, මෙම වැඩසටහනේදී කාන්තා හා ළමා හිංසනය පිළිබඳ පවතින සෑම කරුණක් පිළිබඳව වෙන් වෙන් වශයෙන් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.</u>

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා අදහස් දැක්වීම**</u>

රබර්වත්ත පහල පාදිලිගම මාර්ගය ග්‍රාම සේවා වසම් 10 ක පමණ ජනතාව ප්‍රවාහනය සඳහා පහසුකම් ලබා ගන්නා මාර්ගයකි. එකී මාර්ගය ගමන් කිරීමට නොහැකි ලෙසට දැඩි අබලන් තත්ත්වයේ පසුවන බැවින්, අලුත්වැඩියා කර දෙන ලෙසට මාසික මහා සභා කිහිපයකදී ද මා අදහස්

දක්වන ලදී. මාර්ගය අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයක් පවතින්නේ නම්, ගමන් කිරීමට හැකි වන සේ මෝටර් ග්‍රේඩර් හෝ කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම**</u>

හෙට දින එනම් 2022.11.18 දින අප පක්ෂයටත්, රටවාසී ජනතාවටත් සුවිශේෂී දිනයක් ලෙස සඳහන් කළ හැකිය. අප රට කුරිරු යුද්ධයෙන් බේරාගත් 05 වන විධායක අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ හෙට දිනට යෙදෙන ජන්ම දිනයට මාගේ හදවතින්ම මා සුභ උපන් දිනයක් ප්‍රාර්ථනා කරමි.

❖ <u>**ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම**</u>

අප පාලන කාලයේ වසර 04 ක් මේ වන විට අවසන් වී ඇති බැවින්, එම කාලය තුළ අප විසින් සිදු කරන්නා වූ ව්‍යාපෘති, සංවර්ධන කටයුතු සහ පොදු සේවාවන් Presentation එකක් මගින් සියලුම දෙනාගේ මතකයන් අවදි කරවීම සඳහා අද දින ඉදිරිපත් කිරීමට කටයුතු කළ බව ප්‍රකාශ කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සම්මත කර ගැනීම සඳහා පැවැත්වෙන විශේෂ මහා සභාව පැවැත්වෙන දිනට සියලුම දෙනා පැමිණ 2023 වර්ෂයේ ජනතාවාදි අයවැය සම්මත කර ගැනීම සඳහා සහාය ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

එසේම 2023 අයවැය සකස් කිරීම සඳහා දැඩි මැදිහත්වීමක් ලබා දුන් ලේකම්තුමියටත්, විෂය නිලධාරීටත් ස්තුතිය පුද කරන ලදී.

තිස්සමහාරාම බල ප්‍රදේශයේ සහ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අදාළ පුවත් වාර්තා ගත කරමින් රටට නිවැරදිව පුවත් වාර්තා කරන මාධ්‍යවේදී ප්‍රේමසිරි මහතාටත් මහා සභාවට පැමිණීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම්තුමියටත්, මාධ්‍යවේදී මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 01.30 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2023 වර්ෂයේ අයවැය සම්මත කර ගැනීම සඳහා වන විශේෂ මහා සභාව 2022.12.05 වන දින පැවැත්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.11.17 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.